Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

**SAMODHANA**

**Vol. 9, Issue 1, (June) 2020**

*The Journal of Faculty of Social Sciences and Humanities*

# පුරාණ ලක්දිව කාන්තාවගේ ගෘහීය කළමනාකරණ උපායමාර්ග

**එම්. කේ. එල්. අයිරාංගනී***
මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය
*Correspondence: *iranganimkl@yahoo.com*

Received: 06 June 2020
Accepted: 07 October 2020

## Abstract

In ancient Hindu culture, a woman's childhood was administered by her father, her youth by her husband, and her old age by her sons. She was directed only for reproduction and household work, but there was no social freedom. Due to the influence of Buddhism which arrived Ceylon in the 3rd century BC, the women in the country were divided into two main groups namely Bhikkhuni and Upasika. As a result, Sri Lankan women gained a specific identity. The historical sources revealed that the women, who have been involved in multiple roles such as wife, pregnant women, mother, and friend, have specialized in different disciplines in a large area of family life such as medicine, nursing, farming, and cooking. The housewife's specifically succeded in the areas of managing her husband's income wisely, contributing labor to that earnings, socializing a healthy and a virtuous group of children, meeting the diverse needs of the household members and developing cooperation with the outside household. Thus, the purpose of this research is to identify the household management skills of the ancient woman in order to socialize their perpetual importance and to provide lessons to the modern generation. The research was conducted in order to determine the role of women in balanced household development of multidisciplinary areas such as economy, nutrition, health, social ethics, teaching, internal and external relationships in family management. In this study, primary sources were primarily considered, and facts were analyzed using the comparative historical research method and content analysis.

**Keywords:** economy, household management, knowledge, Sri Lanka, women

## 1. හැඳින්වීම

ක්‍රිස්තු පූර්ව තෙවැනි සියවසේ සිදු වූ මහින්දාගමනයත් සමඟ දේශීය සමාජ සන්දර්භය මුළුමනින්ම පාහේ බුදු දහමේ ස්පර්ශයට ලක් විය. සමීපතම රාජ්‍යය වූ භාරතයේ සමකාලීනව වර්ධනය වූ අශෝක ධර්මය කේන්ද්‍රීය වූ හින්දු සමාජ පසුබිම තුළ කාන්තාවගේ සමාජීය තත්ත්වයෙහි යහපත් ප්‍රවණතා පෙන්නුම් කරන පසුබිමක තදාසන්නව පිහිටි ලක්දිව; සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ කාන්තාව නිදහස් ජීවන රටාවකට උරුමකම් කීවා ය. බෞද්ධාලෝකයෙන් ප්‍රමුදිත දේශීය සමාජය භික්ෂු, භික්ෂුණී- උපාසක, උපාසිකා යන චතුර් කුලකයකට අන්තර්ග්‍රහණය වීම නිසා තවමත් හින්දු සමාජයේ ඉතිරිව පැවති පුරුෂ කේන්ද්‍රීය මතවාදයන් හෝ කාන්තාව පහත් කොට සැළකීමේ ප්‍රවණතා එයාකාරයෙන් ම ලාංකේය සමාජ සංස්ථාවට සංක්‍රමණය නොවුණි. සමාජ, ආර්ථික, දේශපාලන, හා ආගමික යන සෑම අංශයකදීම ඇය පුරුෂ පක්ෂය මෙන් ම සිය දායකත්වය ලබාදෙමින් සමාජ යහපැවැත්ම හා අභිවෘද්ධිය උදෙසා කටයුතු කළාය. අවැසි අවස්ථාවන්හී රටට දේශපාලන නායකත්වය, උපදේශනය, ලබාදුන් මෙරට කාන්තාව; ගමේ පන්සලේ ආගමික කාර්යයන්හි පෙරමුණ ගත් උපාසිකාව පමණක් නොව ගෘහස්ථ ජීවිතයේ ස්වාමියා හා දුක - සතුට බෙදා හදා ගත් සෙනෙහෙබර ස්වාමි දියණිය මෙන්ම දරුවන් පෝෂණය කළ ආදරණීය මාතාව ද වූවා ය. කුටුම්භ ජීවිතය තුළ දහදිය, ශ්‍රමය වගුරුවමින් පුරුෂයා ආර්ථික සම්පත් ජනනය කරනු සමගාමීව ගෘහණිය දරුවන් බිහි කරමින්, ඔවුන් රැකබලා ගනිමින්, වැඩිහිටියන් රකිමින්, යහපත් සමාජ සම්බන්ධතා පවත්වා ගනිමින් බිරිඳක්, මවක්, සාත්තු සේවිකාවක් මෙන්ම මිතුරියක් හා උවැසියක් ලෙස නිවස මූලික කරගත් බහු කාර්යය සේවා නියුක්තිකයෙකු වූ ආකාරය මූලාශ්‍ර සාධක තුළින් හඳුනාගත හැකි වේ. සමස්තය මුදලට යට වූ සමාජයක වෙසෙන නූතනයාට පැරණි මූලාශ්‍රය තුළින් පිළිබිඹු කරන බෞද්ධ සිරිත් විරිත්වලින් පණ පෙවුණු ස්ත්‍රී චරිතාපදානය තුළින් උගත හැකි පාඩම් අතිමහත් යැයි සිතමි.

## 2. අරමුණ හා ක්‍රමවේදය

පහළොස්වැනි ශතවර්ෂයට පෙර ලියැවුණු සාහිත්‍යය සහ සෙල්ලිපි සාධක මූලාශ්‍රයය වශයෙන් භාවිත කෙරෙන මෙම අධ්‍යයනය තුළ ගෘහණිය විසින් කුටුම්භ ජීවිතයේ සාර්ථකත්වය ලබා ගනිමින් මනා වූ සමාජ සම්බන්ධතා වර්ධනය කරගත්තේ කෙසේද යන්න පැතිකඩ කිහිපයක් ඔස්සේ විමර්ශනය කරනු ලබයි. එහිදී ශ්‍රී ලාංකේය සිංහල බෞද්ධ සමාජ ක්‍රමය තුළ කාන්තාව පිළිබඳව පැවති ආකල්පය සමකාලීන භාරතීය සමාජය සමඟ සංසන්දනය කරමින් අධ්‍යයනය කෙරෙන අතර නිවස තුළ බිරිඳක්, ගැබිනියක්, මවක්, මිතුරියක් සහ විශේෂයෙන්ම ගෘහණියක් වශයෙන් එම බහුවිධ භූමිකාවන් හැසිරවීමෙහි ලා පුරාණ කාන්තාව සතු වූ දක්ෂතාවය කෙබඳුද යන්නත්, ස්වාමියා විසින් උපයා සපයා ගන්නා ආදායම් මනා අරපිරිමැස්මකින් යුතුව පාලනය කිරීම, තමන් ද ඒ සඳහා ශ්‍රම දායකත්වය සැපයීම සිදු කළ ගෘහණිය කුටුම්භය තුළ වූ අනේකවිධ අවශ්‍යතාවයන් ස්වෝත්සාහයෙන් පූර්ණය කිරීමට තැත්කළ ආකාරය මූලාශ්‍රගත තොරතුරු මඟින් අධ්‍යයනය කෙරෙයි. ආර්ථික, සමාජ සහ සදාචාර සංවර්ධනය යන අංශයන් ඔස්සේ තම කුටුම්භය මෙහෙයවීම තුළ ගෘහණිය කෙතරම් සාර්ථක වී ඇත් ද යන්න හඳුනාගන්නා අතර කුටුම්භය සහ සමාජය සම්බන්ධ කළ පාලමක් වශයෙන් ඇය කෙසේ කටයුතු කළේ ද යන්න විමර්ශනයට භාජනය වේ.

අධ්‍යයන ක්‍රමවේදය සැළකිල්ලට ගැනීමේදී බෞද්ධ සාහිත්‍යය, වෙදපොත්, සන්දේශ කාව්‍යය හා සෙල්ලිපි වැනි ප්‍රාථමික මූලාශ්‍රය අසුරින් දත්ත එක්රැස්කර ගන්නා අතර ඓතිහාසික සංසන්දනාත්මක ක්‍රමවේදය (Historical Comparative Method) සහ අන්තර්ගතය විශ්ලේෂණය (Content Analysis) යන ශිල්ප ක්‍රම උපයුක්ත කොට ගනිමින් දත්ත විශ්ලේෂණය කරනු ලැබේ.

## 3. සාකච්ඡාව හා ප්‍රතිඵල

### 3.1 සිංහල බෞද්ධ සමාජයේ කාන්තාව

පෙරදිග සමාජ ක්‍රමයේ මූලික ශිෂ්ටාචාරය වශයෙන් හඳුනාගන්නා ඉන්දු නිම්න ශිෂ්ටාචාරය තුළ කාන්තාව උසස් ස්ථානයක ලා සැළකුණු බව එකී ශිෂ්ටාචාරයෙන් හමුවන මව් දෙවඟනගේ මූර්ති සහ මුද්‍රා සාධක තුළින් විවරණය කරගත හැකි වූවත් ඉන්දු නිම්නයේ බිඳ වැටීමෙන් අනතුරුව භාරතයේ බිහිවන වෛදික ශිෂ්ටාචාර සමයේ කාන්තාවට හිමි වන්නේ පහළ සමාජ ස්ථරයකි. හුදෙක් දරුවන් බිහි කිරීම සහ ස්වාමිපුරුෂයාගේ අවශ්‍යතා ඉටුකරමින් නිවස තුළ සියළු කාර්යභාරයන් ඉටු කිරීමේ වගකීම දරාගත් කාන්තාවට සමාජමය වශයෙන් නිදහසක් හිමි නොවීය. කාන්තාව ළමා අවධියේ දී පියා යටතේත්, විවාහයෙන් අනතුරුව ස්වාමිපුරුෂයා යටතේත්, ස්වාමියාගේ මරණින් අනතුරුව පුත්‍රයින් යටතේත් විසිය යුතු යැයි පෙන්වා දෙන **මනුස්මෘතිය** ඇයට ස්වාධීනත්වයක් ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත (මුණසිංහ, 2001:111). විශේෂයෙන්ම චතුර්වර්ණයන්ගෙන් නිර්මාණය වූ භාරතීය සමාජයෙහි බ්‍රාහ්මණ කාන්තාවන්ට වුව හිමි වූයේ ශුද්‍රයෙකුට හිමි වූ සමාජ තත්ත්වයයි. මේ තුළ කාන්තාව අතිශය පීඩාකාරී ජීවිතයක් උරුමව සිටි බව, පහත දැක්වෙන සුමංගලමාතා භික්ෂුණියගේ ථේරි ගාථාවෙන් අවබෝධ කරගත හැකි වේ.

> "සුමුත්තිකෙ සුමුත්තිකෙ සාධු මුත්තිකාම්හි මුසලස්ස,
> අහිරිකො මෙ ඡත්තකං වාපි උක්ඛලිකා මේ දෙඩ්ඩුභං වාතී"
>
> (ථේරීගාථාපාළි, 1972:10)

මෙම කාන්තාව මොහොලින් (කෙටීම් පෙළීම් ආදී නිවසේ නානාප්‍රකාර කාර්යයන්ගෙන්) ද, තම නුරුස්නා සැමියාගෙන් ද, දිවි තකා කෙරෙන ඡත්‍රයෙන් ද, අම්හිරි දුගඳ හමන හැලි වළං ආදී කාර්යයන්ගෙන් ද මිදුණ බව දක්වමින් සතුට ප්‍රකාශ කර මෙම ගීය රචනා කර ඇත. භාරතීය හින්දු සංස්කෘතිය තුළ මෙසේ පීඩාවට පත්ව සිටි කාන්තාවට ස්වාධීනත්වයක් ලබා දෙනුයේ බෞද්ධ දර්ශනය තුළිනි. ප්‍රජාපතී ගෝතමිය ප්‍රමුඛ කාන්තා පිරිසට පැවිද්ද ලබා දෙමින් ද, විශාඛාව ප්‍රමුඛ උපාසිකා පර්ෂදයේ වර්ධනයෙන් ද භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා යන සිව්වනක් පිරිස වශයෙන් සමාජය සංවිධානය වීමත් සමඟ ඇති නැති, ස්ත්‍රී පුරුෂ, පන්ති පරතරය ඉවත් වී ගිහි පැවිදි යන පරතරය පමණක් බෞද්ධ සමාජයෙහි දක්නට ලැබුණි. ඒ අනුව කුටුම්භය තුළ දියණිය, බිරිඳ, මව, මිත්තනිය, ගෘහණිය ආදී වශයෙන් වූ භූමිකාවන් ගණනාවක් දක්ෂ ලෙස හසුරුවමින් ක්‍රියා කළ කාන්තාව බුදු දහම තුළ ප්‍රසංශාවට ලක් ව ඇත. එවැනි ස්ත්‍රීන් පතිපූජිකා, කුලනන්දිනී, ජන රංජනී, ධර්මචාරිණී සහ උත්තම ස්ත්‍රී[1] වැනි නාමයන්ගෙන් හඳුන්වා ඇති (සද්ධර්මාලංකාරය, 1997:73-764) අතර පුරුෂ පක්ෂය විසින් ඔවුන් ආරක්ෂා කළ යුතු බව පෙන්වා දෙයි. සිඟාලෝවාද සූත්‍රය, මධුරක සූත්‍රය, නකුලපිතු සූත්‍රය, සමජීව සූත්‍රය, සප්තභරියා සූත්‍රය(සුජාතාසර සුණ්හා

සූත්‍රය) සහ චතුසංවාස සූත්‍රය යනාදී බෞද්ධ සූත්‍ර දේශනා ගණනාවකින් කාන්තාවන්ට සහ අඹුසැමියන්ට අවශ්‍යය උපදේශ ගණනාවක් පෙන්වා දී ඇත. බුදුරජාණන් වහන්සේ මධුරක සූත්‍ර දේශනාව තුළින්,

> "ගෘහපතියනි, මේ එක්ව වාසය කිරීම් සතරක් වෙත්. කවර සතරක් ද යත්, මළකඳක් මළකඳක් සමඟ වාසය කරයි. මළකඳක් දෙව්දුවක් සමඟ වාසය කරයි. දෙවියෙක් මළකඳක් සමඟ වාසය කරයි. දෙවියෙක් දෙව්දුවක් සමඟ වාසය කරයි" (අංගුත්තර නිකාය - 2, 2014:538).

යනුවෙන් පෙන්වා දෙමින් දෙවියෙක් දෙව්දුවක් සමඟ වාසය කරන ආකාරයේ වූ සාර්ථක කුටුම්භ ජීවිතයක් ගත කළයුතු බවට උපදේශ ලබා දුන්හ. මේ අනුව අඹුසැමි දෙදෙනාම ශ්‍රද්ධාවන්තව, සංයමයෙන් යුක්තව, ධාර්මිකව සහ ප්‍රිය වචනවලින් යුක්තව ජීවත් වන්නේ නම් ඔවුන්ගේ වස්තුව වර්ධනය වී සැපපහසු ජීවිතයක් උදාකරගත හැකි බව පෙන්වා දෙන අතර සමාන පැවතුම් ඇති අඹුසැමි දෙදෙනාම මෙලොවත් පරලොවත් සැපවත් වන හෙයින් ධර්මයේ හැසිරෙන ලෙසට නකුල පිතු සූත්‍රය (අංගුත්තර නිකාය - 2, 2014:541) මගින් දේශනා කර ඇත.

මහින්දාගමනයත් සමඟ මෙම බෞද්ධ මතවාද දේශීය සමාජ සංස්කෘතිය තුළ ස්ථාපිත වීමත් සමග ලාංකේය කුටුම්භ ජීවිතය ද හැඩගැසෙනුයේ ඊට අනුගතව ය. මහින්දාග මනයත් සමඟ බුදු සසුන තුළ උපාසිකාවන් වශයෙන් කටයුතු කරන අනුලා බිසව ඇතුළු කාන්තා පිරිස දුමින්දාගමනයෙන් අනතුරුව පැවිදි උපසම්පදාව ලබා ගත්හ. ඒ තුළ දේශීය සමාජය ද භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා යන සිව්වනක් පිරිසගෙන් සකස් වෙමින් මෙරටට අනන්‍ය වූ සංස්කෘතියක් බිහිකර ගන්නා අතර රාජ්‍යය පාලනයේ පටන් ගෘහ ජීවිතය දක්වාම බුදු දහමෙන් ලත් සාරධර්ම පද්ධතියේ බලපෑම දක්නට ලැබෙයි. ස්වාධීන ජීවිතයකට උරුමකම් කියන දේශීය කාන්තාව දියණියක, බිරිඳක, ගැබිනියක, මවක සහ ගෘහණියක වශයෙන් තම නිවස තුළ ඉටුකළ යුතු කාර්යභාරයන් ගණනාව පමණක් නොව සමාජයේ එක් සාමාජිකාවක වශයෙන් සහ බෞද්ධ උපාසිකාවක වශයෙන් ඉටු විය යුතු සමාජීය වගකීම් රාශියක් ද නොපිරිහෙළා ඉටු කිරීමට කටයුතු කර ඇත්තේ තමන්ට හිමි වූ ස්වාධීනත්වය භාවිත කරමින් ය.

### 3.2 ගෘහණියගේ බහුවිධ භූමිකාවන්

මව් පිය සෙවනෙහි හැදී වැඩෙන කාන්තාව විවාහ වී තම ස්වාමියා සමඟ නව ගෘහ ජීවිතයකට ඇතුල් වීමත් සමඟ ඈ වටා ඒකරාශී වන වගකීම් සහ යුතුකම් ගණනාවකි. ස්වාමියා ප්‍රමුඛ නිවැසියන්ගේ ආහාර, සෞඛ්‍යය, ඇඳුම් පැළඳුම් ආදී එදිනෙදා අවශ්‍යතාවන් ද, ස්වාමියා, ස්වාමියාගේ මව්පියන් ඇතුළු ඥාති හිතවතුන්ගේ, අසල්වැසියන්ගේ සහ සේවක සේවිකාවන්ගේ සිත් දිනාගනිමින් ඔවුන් විසින් පුරුදු පුහුණු කරන ලද සමාජ සාරධර්ම පද්ධතියට අනුගත වෙමින් ද, බෞද්ධ උපාසිකාවක වශයෙන් ඉටුවිය යුතු වගකීම් ඉටුකරමින් ද, දරුවන් බිහි කිරීම සහ සදාචාරසම්පන්න දරු පරපුරක් දායාද කරමින් ද ඈ තම උර මත දරාගත් වගකීම් සමුදාය නිසි ආකාරයෙන් ඉටු කිරීම මත විවාහ ජීවිතයේ රඳා පැවැත්ම තීරණය විය. **සද්ධර්මරත්නාවලියෙහි** විශාකා සිටු දියණිය විවාහ කර දීම පිළිබඳ දක්වන කතුවරයා 'නැඳිමයිලන්ගේ ගෙයි රඳා හිඳිනා කල නම් ඇතුළෙන් ගිනි පිටතටත්

නොදිය යුත්තේ ය. පිටතින් ගිනි ඇතුළටත් නොගත යුත්තේ ය (සද්ධර්මරත්නාවලිය, 2011:399). යනාදි වශයෙන් පියා දුන් උපදේශ මත විශාකාව තම ස්වාමියාගේ නිවසේ දී සාර්ථක ගෘහණියක්ව කටයුතු කළ ආකාරය පෙන්වා දෙයි. සප්තභරියා සූත්‍රය මඟින් භාර්යාවන් සත් දෙනෙකු පිළිබඳව විවරණය කරන බුදුහිමි විශාකා මහෝපාසිකාවට පෙන්වා දී ඇත්තේ ස්වාමියාට වධකයෙකු මෙන් සළකන වධක භාර්යාව, සෙරක මෙන් සළකන චෝර භාර්යාව, ස්වාමියෙකු මෙන් සළකන ස්වාමි භාර්යාව, මවක මෙන් සළකන මාතෘ භාර්යාව, සොහොයුරියක මෙන් සළකන භගිනී භාර්යාව, මිතුරියක මෙන් සළකන මිත්‍ර භාර්යාව සහ සේවිකාවක මෙන් සළකන දාසි භාර්යාව යන භාර්යාවන් සමාජයෙහි දක්නට හැකි බවයි (අංගුත්තර නිකාය -3, 2014:538). සිඟාලෝවාද සූත්‍රයේ දී බිරිඳ විසින් ස්වාමියා වෙනුවෙන් ඉටුකළ යුතු පස් ආකාර වූ යුතුකම් සහ වගකීම් පිළිබඳ දක්වා ඇත. හොඳින් කටයුතු පිළියෙළ කිරීම, පිරිවර ජනයාට හොඳින් සංග්‍රහ කිරීම, පරපුරුෂයන් සේවනය නොකිරීම, සැමියා රැස්කළ වස්තුව ආරක්ෂා කිරීම හා සියලු කටයුතුවල දක්ෂ වෙමින් අලස නොවී ක්‍රියා කිරීමයි” (දීඝ නිකාය-3, 2013:1221).

ස්වාමියා විසින් කෘෂි හෝ වෙනත් කර්මාන්තයක නියැළෙමින් නිවසේ ආර්ථිකය ශක්තිමත් කිරීමට වෙහෙසෙන අතරවාරයේ බිරිඳ නිවසේ එදිනෙදා පැවැත්මට අවශ්‍ය කුඩුමහත් කටයුතු සියල්ලම සම්පාදනය කරමින් ආර්ථික කටයුතු සඳහා ද දායකත්වය දක්වන්නීය. දිනය පුරා වෙහෙසෙන ස්වාමිපුරුෂයාගේ සෞඛ්‍යාරක්ෂාව, පෝෂණ අවශ්‍යතා ඇතුළු සෙසු සියලු අවශ්‍යතාවන් ද ඉටු කරමින් කුටුම්භ ජීවිතයෙහි ඇති සමගිය, සමාදානය මෙන්ම සන්තෘෂ්ටිය රඳවා තබාගැනීමෙහිලා බිරිඳ උත්සුක වන්නීය. **සීහලවත්ථුප්පකරණයේ** හරිතාලතිස්සගේ කතා වස්තුවෙහි එන බිරිඳ තම ස්වාමියා වෙහෙස වී නිවසට ආ ඇසිල්ලෙහි ඔහුට ආහාර සම්පාදනය කරන අතරතුර, නිවසට පැමිණි භික්ෂුවගේ සහයට හරිතාලතිස්සයන් ද නැවත පිටත්වන අතර ආහාර ගනිමින් සිටි තම ස්වාමියාට ගෙන ආ දිය බඳුන අත නොහැර ඔහු නැවත එන තෙක් රාත්‍රිය පුරා බලා හිඳ ඇත්තේ ස්වාමි භක්තිය ප්‍රකට කරමිනි (ඉතා පැරණි බණ කථා,2006:8). ගුණවත් සත්‍රීන් සතු පතිභක්තිය පිළිබඳ දක්වන **සද්ධර්මරත්නාවලී** කතුවරයා මිරිඟු දිය ගෙනවුත් බඳුන් පුරවා තබාගනිමින් ප්‍රයෝජන වින්ඳ ද අන්‍ය පුරුෂයන් සමඟ සම්බන්ධතා නොපවත්වන බව නන්දිවාණිජ වස්තුවේ (සද්ධර්මරත්නාවලිය,2011:773) දී පෙන්වා දෙයි. තම ස්වාමිපුරුෂයා යම්කිසි ආකාරයකින් සමාජ සදාචාරධර්මයන්ගෙන් දුරස්ථ වේ නම් ඒ පිළිබඳව පැහැදිලි කර දී ස්වාමි භක්තියෙන් යුත් උපදේශිකාවක වශයෙන් කටයුතු කළ ගෘහණියෝ ස්වාමියා යහමඟට ගැනීමට උත්සහ කළේ මාතෘ ගුණයන් ප්‍රකට කරමින් ය. **සද්ධර්මාලංකාරයේ** එන වානර වස්තුවෙහි ස්වාමිපුරුෂයා විසින් තමන්ට උපකාර කළ වානරයා මරා දැමූ බව ඇසූ භාර්යයාව එකී පාපකර්මයෙහි ප්‍රතිවිපාකයන් කවරේ දැයි පෙන්වා දෙමින් තම ස්වාමියා පංචශීලයට අනුගත කිරීමට උත්සහ කිරීම (සද්ධර්මාලංකාරය:1997:750) ඊට නිදර්ශනයක් වශයෙන් ගත හැකි ය.

බිරිඳක වශයෙන් ගෘහ ජීවිතයට යොමුවන කාන්තාවගේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ මව්පදවිය ලබා ගැනීමයි. රෝහණයේ කාවන්තිස්ස රජුගේ බිසව වූ විහාරමහා දේවිය විවාහයෙන් අනතුරුව දරුඵල නොමැතියෙන් චිත්ත පීඩාවට පත්ව ‘ස්වාමීනී, මා වඳ වුව, දරු සිරි නැති අපට සම්පත්තියෙන් ප්‍රයෝජන කිම්දැයි (එම:516) ප්‍රකාශ කරමින්

මරණාසන්නව සිටි සාමණේර නමකගෙන් තම කුසෙහි උපදිනා ලෙස අයදින්නට පවා යොමු ව ඇත. විශේෂයෙන්ම දරුවන් නොලත් කාන්තාවන් සමාජයේ අපකීර්තියට බඳුන් වූ හෙයින් විවාහයත් සමඟ දරුවෙකු ද අපේක්ෂා කළහ. දරු කලලයක් කුස පිළිසිඳ ගැනීමත් සමඟ ගර්භණියගේ එදිනෙදා ක්‍රියාකාරකම් යම් තරමකින් වෙනස්වන අතර සිදුහත් කුමරු පිළිසිඳගත් මහමායාව උෂ්ණ ආහාර, ශීත ආහාර, කටුක ආහාර ආදිය නොගෙන නින්දේ දී පවා දරුවාට හානියක් නොවන ඉරියව්වක සිටිමින් ගර්භය රැක ගැනීමට මහත් පරිශ්‍රමයක් දැරූ බව ප්‍රසව පූජා කථා විස්තර කරන **පූජාවලී** කතුවරයා සඳහන් කරයි (පූජාවලිය, 1999:131). ගර්භණී මව එක් එක් මාසයේදී ගත යුතු ඖෂධ සහ ආහාර වර්ගත්, ඇයට වැළඳෙන රෝගාබාධයන්ට ප්‍රතිකාරත් දක්වමින් ගර්භණී චිකිත්සා නමින් වෙදපොත් රචනා වී ඇති අතර (සාරාර්ථ සංග්‍රහය, 1987:190-213) පැරැන්නන් එදිනෙදා ආහාරයට ගත් මී පැණි, සීනි, එළකිරි, ඇල්සහල්, වෙඬරු, ගිතෙල් සහ උඳු කැඳ යනාදිය ගබ්සාවීම් වළක්වා ගර්භණීන්ගේ පෝෂණ වර්ධනයට (යෝගරත්නාකරය 1, 1996:41-43) හේතුවන බව දක්වා ඇත. කුස ඔත් දරුවාගේ පෝෂණයට අවශ්‍යය ආහාර වර්ග තෝරා බේරා ගත් ගැබිනිය තම එදිනෙදා ක්‍රියාකාරකම් පවා සීමා කර ඇත. නමුත් දරු ගැබ දරාගත්තේ වුව ඇය තමාගෙන් නිවසට ඉටුවිය යුතු වගකීම් පැහැර හැරියේ නැති වග **සද්ධර්මරත්නාකරයේ** එන චිත්තහත්ථ ස්ථවිර කථා වස්තුවෙන් හඳුනාගත හැකි වේ. එහි එන ගැබිණි කාන්තාව තම සැමියා ගොවිතැනෙහි නිරත වී නිවසට එන විට 'මෝල් කොට විඩාව තමා බවත් නොදන අපර හරව වැද හෙවන්නීය' (සද්ධර්මරත්නාකරය, 2001:425) යනුවෙන් දැක්වීමෙන් සැමියාට සහ නිවැසියන්ට ආහාර පිළියෙළ කිරීමේ වගකීම කෙතරම් ශාරීරික අපහසුතා මධ්‍යයේ වුව ඇය විසින් පැහැර නොහැරි බව අවබෝධ කරගත හැකි වේ.

පුරාතන කාන්තාව නූතනයේ මෙන් එක් දරුවෙකු හෝ දෙදෙනෙකුට සීමා නොවී දහයකට වැඩි දරුවන් ගණනක් බිහි කරමින් එම සෑම දරුවෙකු ම පාහේ නිරෝගී සහ සාදාචාර ධර්මයන්ට අනුගත දරුවන් වශයෙන් සමාජගත කළහ. පඬුවස්දෙව් රජුගේ බිසව වූ භද්දකච්ඡායනාව දරුවන් එකොළොස්දෙනෙකු (මහාවංසය, 2012:9:1:40) බිහිකළ අතර මුටසිව රජුගේ අගමෙහෙසියට දරුවන් දොළොස්දෙනෙකි (දීපවංසය,1970:181). මූලාශ්‍රය අධ්‍යයනය කිරීමෙන් මෙසේ පුරාණ කාන්තාව දහයකට වැඩි දරුවන් පිරිසක් නිරෝගීව බිහිකර හදා වඩා ගත් බව හඳුනාගත හැකි අතර ඇය දරුවන් වැදීමෙන් කිසිදාක සෑහීමකට පත් නොවූ බවද දක්වා තිබේ (කාව්‍යශේඛරය, 2006:265). තම දරුවන්ගේ පෝෂණය පිළිබඳව මහත් සැළකිල්ලක් දැක්වූ පුරාණ මව ඒ සඳහා විශාල පරිශ්‍රමයක් දරා ඇත. "අනුන්ගේ ගෙවල්වල බැලමෙහෙවර කොට තම දරුවන් පෝෂණය කළාය"(සීහලවත්ථුවේ සිංහල අනුවාදය: 2006:76) යනුවෙන් හංකාලාවගේ කථා වස්තුව දක්වන **සීහලවත්ථුප්පකරණය** සඳහන් කරනුයේ එහෙයිනි. දරුවන් සදාචාරධර්මයන් සපිරි පුද්ගලයන් වශයෙන් සමාජය සමඟ ගැටීමට අවශ්‍ය දැනුම සහිත ව වර්ධනය කිරීමේ වගකීම ද තමන් සතු වූ හෙයින් මව්වරු තම දරුවන් සමඟ නිතර නිතර වෙහෙර විහාරස්ථාන වෙත ගොස් දාන මානාදී පින්කම්වල යෙදුනහ. සාලිරාජ වස්තුවෙහි එන සුමනා නම් දැරිය කැටිව විහාරයට යන මවගේ අපේක්ෂාව වූයේ තම දරුවා ආගම දහමට යොමු කිරීම වූ අතර තමන්ට පෙර නිවසට පැමිණි දියණිය බත් උළු විසිර යන පරිදි නිවස අපිරිසිදු කර තිබූ හෙයින් ඇට,

"එම්බල චණ්ඩාල කෙල්ල, මාගේ ගෙය කුමක් පිණිස දූෂ්‍ය කෙරෙයිදැයි..."

යනාදී වශයෙන් තරවටු කරණුයේ ඇ හික්මවාගනු පිණිසය (සද්ධර්මාලංකාරය, 1997:634-635). දුටුගැමුණු සහ සද්ධාතිස්ස යන කුමාරවරුන් බුදු දහමට නැඹුරු කිරීමටත්, දරු දෙදෙනා අතර සමගිය වර්ධනය කිරීමටත් විහාරමහා දේවිය ඔවුන් දෙදෙනා ශපථ කරගනුයේ (මහාවංශය, 22:79-81:95) ඔවුන් අනාගත රාජ්‍යය පාලකයන් වශයෙන් ගුණධර්ම දත් ධාර්මික දරුවන් කරනු අටියෙනි. දරුවන්ගේ විවාහයෙන් පසුව වුව ද ඔවුන් පිළිබඳව සොයා බලමින් ඔවුන්ගේ යහපත සළසනු පිණිස මව්වරුන් ඇපකැප වූ අතර චිත්තහස්ථ ස්ථවිර කථා වස්තුවේ එන මව තම දියණියගේ සැමියා සත් වාරයක්ම දියණිය හැර දමා පැවිදි වීමට ගිය හෙයින් බිය වී හත්වැනි වාරයේ සැමියා කළකිරීමට පත්ව එසේ පළා යනු දැක දියණියට අවවාද දෙනුයේ "කාලකණ්ණිය, නැගී සිටුව තිගේ වල්ලභයා තී වැද හොත් අපරහර දැක කලකිරී දෝ හෝ විහාරය බලා නික්මින" (සද්ධර්මරත්නාකරය, 2007:.388.) යනුවෙනි. මෙසේ දරුවන් ගර්භයේ පිළිසිඳ ගත් දා සිටම ඔවුන් හැදී වැඩී විවාහ කරදීමෙන් අනතුරුව ද මව්වරු තම දරුවන් වෙත දැඩි අවධානයකින් යුක්තව සිටියහ.

නූතනයේ මෙන් රැකියාවන් සමඟ කාර්යබහුල නොවූ පුරාණ ගෘහණියට තම අසල්වැසියන් සහ ඥාති හිතමිත්‍රාදීන් සමඟ මනා වූ මිතුරු සම්බන්ධතා පැවැතිවීමට කාල අවකාශය හිමි විය. දුර බැහැර සිටින නෑදෑයින් දැකබලා ගැනීමට ඔවුහු විවිධ කැවිලි වර්ග ද සාදාගෙන ගිය බව හඳුනාගත හැකි සාධක සාහිත්‍යය මූලාශ්‍ර තුළින් හමු වේ. පණ්ඩුකාභය ළදරු කුමරුවා රැගෙන පලා යන සේවිකාව කුමරුගේ මාමාවරුන්ට ප්‍රකාශ කරනුයේ තම දියණිය දැකීමට යන බවත් ඇයට කැවුම් රැගෙන යන බවත්ය (මහාවංසය, 10:1-4:42). මච්ඡරියකෝසිය සිටාණන්ගේ කථා වස්තුවෙහි එන සිටු දේවිය කැවුම් පිසින්නට සූදානම් වනුයේ තම අසල්වාසී සියලු හිතවතුන් සමඟ බෙදා ගැනීමේ අපේක්ෂාව ඇතිව වීම (සද්ධර්මරත්නාවලිය, 2011:376) ද ඔවුන් හැකි පමණ ආහාරපාන ආදිය ද අසල්වැසියන් සමඟ බෙදා හදාගත් බව අවබෝධ කරගත හැකි වේ. බැමිණිතියා සාගතය අවස්ථාවේ භික්ෂුවකට තම ශරීර මාංශය දන් දීමට තැත් කළ පිණින් පහළ වූ දිව්‍ය ආහාරයෙන් "ඒ පර්වත ප්‍රාන්තයෙහි වාසය කරන මනුෂ්‍යයන් ද, සෙසු දුගීමගී යාචකයන් ද දිව්‍ය ආහාරයෙන්ම සන්තර්පණය කරමින්..." (සද්ධර්මාලංකාරය, 1997:668) පින් දහම් කළ යුවළක් පිළිබඳව සද්ධර්මාලංකාරය සඳහන් කරන අතර පුරාතන අවධියේ ගෘහණියන් තමන් සතු දෑ අන් අය සමඟ බෙදාහදා ගනිමින් සුහදශීලීව සමාජ සත්කාර්යයන්ට ද සහභාගී වූ බව හඳුනාගත හැකි වේ.

ආරෝග්‍යශාලා අවම වූ කාල පරිච්ඡේදයක තම නිවැසියන්ගේ රෝගාබාධයන්ට කළ යුතු වූ පිළියම් හඳුනාගෙන සිටි ගෘහණිය සියළු දරුවන් නිරෝගීව සමාජයට දායාද කළාය. බත ප්‍රධාන ආහාරය වූ බැවින් ද සහල් සුලභ වූ බැවින් ද බත් ආහාරයට ගත් පුරාණ කාන්තාව කොස්, පළා වර්ග, උඳු, තල ආදී ආහාර ද දිනපතාම පාහේ ආහාරයට එකතුකරගැනීම හේතුවෙන් ඔවුන්ගේ තනකිරි වර්ධනය (සාරාර්ථ සංග්‍රහය, 1987:93-94) වී ළදරුවන්ගේ පෝෂණ අවශ්‍යතාවය සම්පූර්ණ වූ අතර ස්වභාවික පෝෂණ ගුණයන්ගෙන් යුත් ආහාරපාන ආදිය පිස නිවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය නංවාලීමට පුරාණ කාන්තාව නිරායාසයෙන්ම යොමු වී ඇත. නිරතුරුවම වෙහෙස වන සිය සැමියාට සාත්තු සේවිකාවක වෙමින් ඇප උපස්ථාන කළ ගෘහණිය පිළිබඳව "වෙස්වලාගෙන ගොයම් කපා වෙහෙස වී ආ ස්වාමියා උණු වතුරෙන් නාවා අත් පා මැඩීම් කළාය" වැනි උද්දෘත තුළින් පැහැදිළි

වේ (සීහලවත්ථුවේ සිංහල අනුවාදය, 2006:28). ස්වාමියා පමණක් නොව තම සැමියාගේ මව්පියන්ට ද ඇප උපස්ථාන කළ අතර තම නිවසට ආ දුටුගැමුණු රජුගේ පා සෝදා තමන් පිසූ ආහාර සියතින්ම පිළිගන්වමින් අශෝකමාලාව සංග්‍රහ කර ඇත්තේ එකී ගෞරවය ප්‍රකට කරමිනි (එම, 25).

කුටුම්භය තුළ එකිනෙකා අතර මනා සබැඳියාවක් ඇති කිරීමෙහිලා ගෘහණිය විසින් ඉටු කළ කාර්යභාරය ද ඇගේ ගෘහ කළමනාකරණයේ වැදගත් වූ අංගයකි. දිනය පුරා නිවසින් බැහැරව ආර්ථිකමය කාර්යයන්හී නිරතවන සැමියා සහ දරුවන් අතර ඇති සම්බන්ධතාවය දුරස්ථ නොවී පවත්වාගැනීමටත් දරුවන්ට තම පියා හට ගරු සරු දැක්වීමට පුරුදු පුහුණු කිරීමටත් මව්වරු උනන්දු වූහ. ගිරිකණ්ඩසිවගේ දියණිය වූ ස්වර්ණපාලී කුමරිය (මහාවංසය, 10:32,43) තම පියාගේ දිවා ආහාරය රැගෙන යන්නේ ද, සුබ රජුගේ දියණිය (එම, 35:104,154) තමන් ඇතිදැඩි කළ පියාණන්ට දිවා ආහාරය රැගෙන යන්නේ ද මෙසේ කුටුම්භය තුළ එකිනෙකා අතර වර්ධනය වූ සහයෝගීතාවය ප්‍රකට කරමිනි. මව්පියන් දෙදෙනා කර්මාන්තයට ගිය පසු නිවසේ කටයුතු දරුවන්ට බාර කරමින් දරුවන්ගේ සහය කුටුම්භයේ සාර්ථකත්වය සඳහා යොදාගත් ගෘහණියන් එම දරුවන් සමාජ සම්බන්ධතා කෙරෙහි යොමු කරවා ඇති බව **සීහලවත්ථුවේ** මහානාග තෙරුන්ගේ කථාවෙහි එන කපු නෙළිමට යන මව්පියන් තම දියණියට දානය සකස්කර භික්ෂුවට පූජා කිරීමට (සීහලවත්ථුවේ සිංහල අනුවාදය, 2006:75) බාර කිරීමෙන් පැහැදිලි වේ. තම දරුවන්ට ද කුටුම්භ පෝෂණය සඳහා අවශ්‍යය ශ්‍රම දායකත්වය ලබා දීමට පුරුදු පුහුණු කරවූ බව කිංචි සංසා වස්තුවෙහි මව්පියන් කිංචි සංසාවට සූප ශාස්ත්‍රය පුහුණු කිරීමෙන් (සද්ධර්මාලංකාරය, 1997:708) ද, සංසාභූත මිත්‍ර ස්ථවිර කථාවෙහි එන මහළු මව දියණියට ආහාර පිසීමට නියම කිරීමෙන් (සද්ධර්මරත්නාකරය, 2007:352) ද හඳුනාගත හැකි වේ.

### 3.3 ගෘහණියගේ ආර්ථික කළමනාකරණය

ගෘහීය ආර්ථික කළමනාකරණය විෂයෙහි කාන්තාවගේ ඥාන සම්භාරය පිළිබඳ විමසීමේදී මූලාශ්‍රයගත සාධක ගණනාවක් ඉස්මතු කොට දැක්විය හැකි ය. තෝනිගල සෙල්ලිපියෙන් සනාථ වන අන්දමට අනුරාධපුර අවධියේ වැසියන් තම පරිභෝජනයෙන් පසු යම්කිසි ධාන්‍ය කොටසක් බැංකු ක්‍රමයක් හා සමාන ස්ථානයක තැන්පත්කර එයින් ලැබෙන පොළියෙන් අරියවංශ පූජාව කරවා ඇත (*Epigraphia Zeylanica, III* :1994:177-178). මෙසේ ධාන්‍ය තැන්පත් කිරීමට පුරුෂයාගේ දක්ෂතාවය පමණක් නොව ගෘහණියගේ මනා අරපිරිමැස්ම ද හේතු වූවා නිසැකය. කමතේ ගොයම් මැඩ අවසන් වූ පසුව පිදුරු ගස්හී ඉතිරිවන වී පවා අපතේ නොයවා එක්තුකර ගැනිමට පුරාණ කාන්තාව යොමු වූ බව **සීහලවත්ථුවේ** චුල්ල උපාසිකාවගේ කථා වස්තුවෙන් පැහැදිලි වේ (සීහලවත්ථුවේ සිංහල අනුවාදය, 2006:72). කෘෂි ආර්ථිකය ප්‍රධාන ජීවනෝපාය කරගත් පැරැන්නන් මඩ ගොවිතැන, හේන් ගොවිතැන සහ ගෙවතු වගාවන් මත පදනම්ව තම ආර්ථිකය ශක්තිමත් කරගත් අතර වෙළෙඳාම සහ විවිධ වෘත්තීන් ද දක්නට හැකි විය. ස්වාමිපුරුෂයා මෙසේ ආර්ථික කටයුතුවල නියැලෙන විට ගෘහණිය නිවසේ සියළු කාර්යයන් පරිපාලනය කළා පමණක් නොව තමන්ට හැකි සෑම අවස්ථාවකම ස්වාමියාට සහය දැක්වූවාය. ස්වාමියා විසින් උපයාගන්නා ආදායම පවුලේ පරිභෝජනයෙන් ද, භික්ෂූණ්ගේ දානමානාදියෙන් ද,

හිතවතුන් සහ යාචකයින්ට දීමෙන් ද අනතුරුව අතිරික්ත කොටසක් තැන්පත්කොට අනාගත අවශ්‍යතාවන් සඳහා ඉතිරිකර ගැනීමට පුරාණ ගෘහණියන් යොමුව සිටිය හ.

**සීහලවත්ථුප්පකරණයේ** එන කම්බුද්ධ උපාසකයාගේ බිරිඳ කුඹුරේ සිටින තම සැමියාට බිත්තර වී සහ දිවා ආහාරය රැගෙන යන (එම, 85) අතර **සද්ධර්මරත්නාකරයේ** පූර්ණක නම් දුගියා සී සානා ස්ථානයට ඔහුගේ බිරිය බත් මාළු පිසගෙන ගිය බව (සද්ධර්මරත්නාකරය, 2007:425) දක්වා තිබීමෙන් කෘෂිකර්මාන්තයෙහි නිරතවන තම ස්වාමියාගේ ආහාර අවශ්‍යතාවන් සැපයීම ගෘහණියගේ එදිනෙදා ජීවිතයේ ප්‍රධානතම කාර්යයක්ව පැවති බව අවබෝධ වේ. මෙසේ කෙතට හෝ හේනට යන ගෘහණිය තම සැමියාට උපකාර කිරීමට ද අමතක නොකළාය. ගෘහණියන් ද කෘෂිකාර්මික කටයුතු සඳහා දායක්වය දැක්වූ අවස්ථා සුලබය. එක් දුගී කාන්තාවක් කොංගු නම් ධාන්‍ය පිරවූ ලබුකැටයක් ගෙන කෙතට ගොස් ඇත්තේ එම ධාන්‍ය වැපිරීමේ කාර්යයටයි (සීහලවත්ථුවේ සිංහල අනුවාදය, 2006:99). තවද කාන්තාවන් වප්මගුල් උත්සවවලට සම්බන්ධ වෙමින් වැපිරීමේ කාර්යයට දායකත්වය දැක්වූ බව ද හෙළි වේ (සද්ධර්මාලංකාරය, 1997:793). සද්ධාතිස්ස රජුගේ බිසව රජු සමඟ එක්ව "ගොයම් මැඩ පිදුරු ඉවත දමා...(සීහලවත්ථුවේ සිංහල අනුවාදය, 2006:28)" යනුවෙන් සඳහන් කිරීමෙන් ද, දුප්පත් මිනිසෙක් තමන්ගේ භාර්යයාව සමඟ "කළවිටිවලැ බොල් කඳු පොළමින් පිදුරු සළමින් මහත් වූ දුකින්..." (සද්ධර්මාලංකාරය, 1997:778) ධාන්‍යය රැස්කළ බව සඳහන් කිරීමෙන් ද ගෘහණිය බැත පෑගීමට ද දායක වූ බව පැහැදිලිය. කුඹුරු ගොවිතැනේදී ස්වාමියාට සහයක් වශයෙන් කෙත් රැකීමේ යෙදුනු ඇල්ගෙවිලියන් පිළිබඳව සඳහන් කරන **සන්දේශය කාව්‍යයන්හී,**

"සලා දුලා පියොවුරු තඹර රොන් රත
පුලා නිලා උපුලන් ලා ගෙනැ කනත
කලා පිලා නොව ඇල් ගෙවි කෙළින ඉත
බලා පලා යව අස්වන් ගුරුළු කෙත"
(සැළලිහිණි සන්දේශය, 2001:37:92)

යනුවෙන් දක්වන අතර සැටදා, සුවඳැල් ආදී කෙත් රකින ගෙවිලියන් (කෝකිල සන්දේශය, 2009:214:151) ද, රතු නෙළුමන් සවන ගවසාගෙන සිටින ඇල් ගෙවිලියන් (ගිරා සන්දේශය, 2009:76:53) ද, වරළස මල් ගවසා සිටින ඇල් ගෙවිලියන් (තිසර සන්දේශය:125::52) ද වර්ණනාවන්ට පාත්‍ර වී සිටිති. මේ අනුව කෙත් රැකීම සඳහා ද ගෘහණියන් තම ශ්‍රම දායකත්වය ලබා දී ඇති බව තහවුරු වේ. ඇතැම් ගෘහණියන් තම කුඩා දරුවන් ද රැගෙන කෘෂි භූමීන් හී සැමියාගේ සහයට ගිය බවට (සද්ධර්මාලංකාරය, 1997:557) තොරතුරු සාහිත්‍ය මූලාශ්‍රයයන්හි සඳහන් වේ.

ස්වාමියා විසින් නෙළාගන්නා අස්වැන්න ගෘහස්ථයේ සමාජිකයින් පෝෂණය සඳහා අරපිරිමැස්මෙන් සකසා දෙන අතරතුර අස්වැන්නෙන් නොඉඳුල් මුල් කොටස මහාසංඝයා උදෙසා සකසා පූජා කළේ ය. ථේරි ගාථාවන් හී දැක්වෙන එක් කාන්තාවක් කුඹුරෙන් හැල් වී නෙළා ඒවා සකස්කර කුඹුරේ වූ පැලේ සිටම විළඳ බැද භික්ෂූන් පන්සියයකට පූජාකර තිබේ (ථේරීගාථා පාළි, 1972:185). **සීහලවත්ථුප්පකරණයේ** ගෘහණියන් විසින් වී කොටා දහයියා සහ සුඹුල් ඉවත්කර ආහාර පිළියෙළ කළ අවස්ථා කථා වස්තූන් කිහිපයකම

හඳුනාගත හැකි වේ (සීහලවත්ථුවේ සිංහල අනුවාදය, 2006:28,85,124). නෙළාගත් ධාන්‍ය අව්වේ වේලා කල්තබා ගන්නා ක්‍රමවේද හැසිර ස්ත්‍රී දැතින්ම ය (මහාවංසය, 21:27-28:90). දුර්භික්ෂ සමයන් හී පරිබෝජනයට අව්වේ වියළා සකස් කළ වී තැන්පත්කර තැබූ ඈ බත් වෙනුවට අල වර්ග සහ ගෙඩි වර්ග ආදිය එදිනෙදා ආහාරයට ගැනීමට යොමු වූ බව සාහිත්‍ය මූලාශ්‍රයගත කථාවස්තූන් හරහා අවබෝධ කරගත හැකි වේ (සීහලවත්ථුවේ සිංහල අනුවාදය, 2006:125). මෙසේ ස්වාමියා විසින් රැස්කරගන්නා ධාන්‍ය අරපරිස්සමින් පරිහරණය කිරීමේ වගකීම ගෘහණියගේ භාරයේ වූ හෙයින්ම දරුවන්ගේ ද, ඉවුම් පිහුම් කටයුතු ද ඇතුළු නිවසේ විවිධ කාර්යයන් අතරමැද වුව ධාන්‍ය සකස්කිරීමෙහි ද නිරත වීමට කාන්තාවෝ උත්සුක වූහ.

නිවසට අවශ්‍ය එළකිරි, ගිතෙල්, දී කිරි, යොදය සහ වෙඬරු ආදී පස්ගෝරසයන් සකස්කරගත් පුරාණ ගෘහණිය කිරි දෙවීමෙහි නිපුණ වූ බව **සීහලවත්ථුවේ** එන හංකාලාවගේ කථා වස්තුවෙන් (සීහලවත්ථුවේ සිංහල අනුවාදය, 2006:78-79) හඳුනාගත හැකි වේ. ඇය නිවැසියන්ගේ යැපීමට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය මුළුතැන්ගෙයි තැන්පත් කරගත් බව "ගෙයි අසවල් තැන නැවුම් සැළියෙහි පෑර පැස තුබූ සුදුහාල් සාලැ, අසවල් තැන කිරියැ, අසවල් තැන සැළියෙහි කකාළ පැණිය" (සද්ධර්මරත්නාකරය, 2007: 352) යනාදී වශයෙන් හදිසි අවස්ථාවකදී වුව ප්‍රයෝජනයට අවශ්‍යය ආහාර ද්‍රව්‍ය ඇය සතු වූ බව දක්වයි. මීට අමතරව උක් ගසින් උක් පැණි වෙන්කර ගැන්මට දක්ෂ වූ කාන්තාවන් සිටි බව "ඕ උක් වත්තට ගොස් උක් ගසක් කඩා පැණි ගැනීම සඳහා මිරිකා.."(සීහලවත්ථුවේ සිංහල අනුවාද, 2006:115) යන පාඨයෙන් හෙළිවේ. භාතිකාභය රජු රුවන්වැලි සෑ මළුවෙහි මී තෙල් යෙදූ පහන් පූජාවක් සිදුකළ බවට සඳහන්වන (මහාවංසය, 34:55-57,147) අතර මෙසේ මී එල එකතුකර නිවසට අවශ්‍ය තෙල් නිෂ්පාදනය කිරීමේ කාර්යය ගෘහණියගේ වගකීමක් වන්නට ඇත. ස්වාමියා විසින් වරින්වර දඩමස් නිවසට ගෙන ආ විට අතිරික්තය කල්තබා ගත හැකි සේ සැකසීමට ගෘහණිය දක්‍ෂ වූ අතර එක් ස්ත්‍රියක් වසරක් පුරා නරක් නොවී තබාගත හැකි ආකාරයට මස් පිසූ බවට සාක්ෂි හමු වේ (සීහලවත්ථුවේ සිංහල අනුවාදය, 2006:113)

නිවැසියන්ට අවශ්‍ය ඇඳුම් පැළඳුම් නිර්මාණයට අවශ්‍ය කපු කැට එයින් ඇඳුම් මැසීම අනුරාධපුර අවධියේ පටන්ම ගෘහණියගේ වගකීමක් ව පැවති බව විජයගේ ලංකාගමනය අවස්ථාවේ කුවේණිය විසින් කපු කටිමින් සිටීමෙන් හඳුනාගත හැකිය (මහාවංසය, 7:11-12,34). විශේෂයෙන් ම භික්ෂු විනය දේශනා කරන බුදු හිමියන් පිඩුසිගා වඩින භික්ෂුවක් යම් නිවසක මිදුලෙහි වැඩසිටිය යුත්තේ ගෘහණිය කපු නූලක් සකස්කරන වේලාවට සමාන කාලයක් පමණක් බව පෙන්වා දී ඇත (මුණසිංහ, 2001:84). මෙසේ විනය නීතියක් පැනවීමෙන්ම කාන්තාව සූක්ෂම කාර්යයක් වූ කපු කැටීමෙහි කෙතරම් දක්ෂ වීද යන්නත්, ඉතා ඉක්මනින් නූලක් නිර්මාණය කිරීමේ හැකියාව ඔවුන් සතු වූ බවත් හෙළිවන අතර මෙහෙයින්ම ලංකාවේ සෑම ගෘහණියකම පාහේ කපු කැටීමෙහි දක්ෂ වූවන්ය යන්න අවබෝධ කරගත හැකි වේ. නිවැසියන්ගේ සියළු අවශ්‍යතාවයන් සැපයීමෙහිලා සකසුරුවම් භාවය ගෘහණියක සතු අනිවාර්ය ලක්ෂණයක් වී ඇත.

බත ප්‍රධාන ආහාරය කරගත් පුරාණ ශ්‍රී ලාංකිකයෝ හේන, කුඹුර, වැව, මහ කැලය සහ ගෙවත්ත වටා විහිදී ගිය ආහාර රටාවකට අනුගතව සිටි හෙයින් මෙහි වූ විවිධ ආහාරවල ඇති පෝෂණ ගුණයන් එක් පිඩක් කොට නිවැසියන් වෙත ලබා දීමේ මනා දැනුමක් පුරාතන

කාන්තාවන් සතු විය. ඇතැම් අවස්ථාවල සූප ශාස්ත්‍රය ප්‍රගුණ කිරීම දූරියන් විසින් උගත යුතු කලාවක් වශයෙන් පැරැන්නන් පිළිගත් බව කිංචි සංඝා කුමරියට ඇගේ මව්පියන් විසින් සූප ශාස්ත්‍රය අභ්‍යාස කරවීමෙන් (සද්ධර්මාලංකාරය, 1997:708) ද, සෝරෙය්‍ය සිටු කුමරු ගැහැණු රුවක් ලැබූ පසු සූප ශාස්ත්‍රය උගැන්මට දිසාපාමොක් ඇඳුරු සමීපයට යන ආකාරයට ගමන් කිරීමෙන් (සද්ධර්මරත්නාවලිය, 2011:340) ද හඳුනාගත හැකි වේ. තම පුත්‍රයාට භාර්යයාවක සොයන මව්පියන් නිවසේ සකලවිධ කටයුතු සඳහා දක්ෂ ලේලියක අපේක්ෂා කර ඇති බව කාලි යකින්නගේ කථා වස්තුවෙහි සඳහන් වේ (එම, 101). මෙම ගෘහණියන් එකම ද්‍රව්‍යය විවිධ ආකාරයෙන් පිසීමට දක්ෂ වූහ. කුඩා දරුවන් සිටින මව්වරුන් දරුවන් සඳහා වෙන් වූ ආහාරයක් සකස්කර ඇති අතර,

> "පළමු පිළියෙල කොට තිබූ කැඳක් අවුළක් නැති හෙයින් ගෙයි බාලයන්ට පිළියෙල කළ ආහාරය දී කිරි, තෙල්, පැණි, සකුරු එක්කොට පාත්‍රවල බහා පිළිගැන්වූහ." (සද්ධර්මාලංකාරය, 1997:794)

යනුවෙන් **සද්ධර්මාලංකාරයෙහි** දක්වෙන ආකාරයට එම ආහාරය තෙල්, කිරි, පැණි ආදිය අවම වූ පෝෂණ ගුණය රඳවාගත් ආහාරයක් වන්නට ඇතැයි නිගමනය කළ හැකිය. විශේෂයෙන්ම දානයක් වශයෙන් භික්ෂූන් වහන්සේලාට පූජා කරන ආහාර පැණි, සකුරු, තෙල් ආදිය යොදා රසමසවුළු සමඟ පිළියෙල කළ ද එදිනෙදා නිවැසියන්ගේ ආහාරය එතරම් වියදම් අධික ලෙස සකස් නොකරන්නට ගෘහණිය සතු වූ අරපිරිමැස්ම ද හේතු වන්නට ඇත.

නිවසට පැමිණි ආගන්තුකයන් සඳහා ද ප්‍රණීත ආහාර වට්ටෝරුවක් පිළියෙල කිරීම ගෘහණිය සතු වගකීමක් වූ බව "අශෝකමාලා දේවී තමන් සිය අතින් පිළියෙල කරන ලද නොයෙක් රසමසවුලෙන් යුක්ත වූ සුවඳ හැල් සාලේ බත් රජ්ජුරුවන් පෙරට තබා තුමූම බත් අනුභව කරවූහ."(එම:638) යන්නෙන් පැහැදිලි වන අතර ඒ හරහා ගෘහණිය බොහෝ පිරිසකගේ සිත දිනාගත්තා නිසැකය. පිණ්ඩපාතයේ වඩින භික්ෂුවකට වුව හැකි ඉක්මනින් දානය සකස්කර දීමට දක්ෂ වූ ගෘහණියෝ එසේ දානයට නිවසේ ඇති ප්‍රණීතම ආහාරය ලබා දීමට පසුබට නොවූහ. "වහ වහා ගෙට වැද තෙල් ඇතිලියක් උඳුනෙහි තබා සුවඳ ගිතෙල් වත්කොට කාඩි බත් සෝධා හැර ගිතෙලින් බැද..." (එම, 84) යනාදී වශයෙන් තම පරිභෝජනයට පිසගත් බත නැවත රස මසවුළු යොදා සකස්කර භික්ෂූණ්ට පූජා කරමින් ඔවුහු තෘප්තිමත් වූහ. තම නිවසට පැමිණෙන වෙළෙඳ, යාචක ආදී පිරිසට ද හැකි පමණ ආගන්තුක සත්කාර කිරීමට ලාංකේය ගෘහණිය උත්සහ කර ඇත්තේ බුදු දහමේ ආභාසය ලත් සංස්කෘතියට ඔවුන් අනුගත වූ බැවිනි. තම නිවසට ආ වෙළෙන්දෙකු දිනය පුරා කුසගින්නේ සිටි බව ඇසූ කාන්තාවක් "අතට පැන් දී ඉන්ට සලස්වා ඕ හට හැල් සාලේ බතක් ලා සුවඳ ගිතෙල් හා සමඟ මොනර මසක් එළවූයේ"(එම,495) යි **සද්ධර්මාලංකාරය** සඳහන් කරයි.

විවිධ කර්මාන්තයන් හී යෙදෙමින් නිවසේ සමෘධිය සැළසූ ස්වාමිපුරුෂයාගේ පෝෂණය පිළිබඳ විශේෂ සැළකිල්ලක් දක්වූ ගෘහණිය දහවල් ආහාරය වැඩබිමට ගෙන යෑම තම දෛනික රාජකාරියක් කරගත් අතර ආහාර හිඟ අවස්ථාවන්වල තම සැමියාගේ ආහාර අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට ඔවුහු බොහෝ කැපවීම් කළහ. සද්ධර්මරත්නාවලියේ

සෝෂක සිටාණන්ගේ කථා වස්තුවෙහි එන ගෘහණියක් "එළඟිතෙල් ඌෟ දිසාවට නමාලා තොමෝ එළඟිතෙල් මද දිසාවෙන් බත් මදක් කෑව. සැම් බොහෝ කොට බත් කා..."(සද්ධර්මරත්නාවලිය, 2011:204) යනාදී වශයෙන් දක්වන්නේ එබැවිනි. ශ්‍රමය වගුරුවන සිය ස්වාමියා වෙනුවෙන් "දෙදෙනා යැපෙන පමණකටත් ආහාරයකට ආධාරයක් නොම ඇති හෙයින් පණ්ණම්බිලියාගු නම් ඇඹුල් කැඳක් පිස තබා..."(සද්ධර්මරත්නාකරය, 2007:421) තමත් ලත් සුළු දෙයින් වුව ස්වාමියාගේ පෝෂණය සළසා ඇත.

පුරාතන කාන්තාවන් සකස්කළ ආහාරයන් අතර බත් සහ කැඳ ප්‍රධානත්වයක් ඉසිලූ බව සාහිත්‍යය ග්‍රන්ථයන් අධ්‍යයනය කිරීමෙන් අවබෝධ වේ. මෙසේ බත් පිසීමේ දී ද විවිධ රසයන්ගෙන් සහ ගුණයන්ගෙන් යුත් බත් පිසීමට ගෘහණියෝ දක්ෂ වූහ. කිරිපිඩු හෙවත් කිරිබත්, කාඩි බත්( සද්ධර්මාලංකාරය, 1997:635), සුවඳ හැල්බත් ආදී වශයෙන් බත් විවිධාකාර වූ අතර එය රස කරන්නට පැණි, ගිතෙල් (සද්ධර්මරත්නාවලිය, 2011:204), කිරි (මහාවංසය, 2012:37:125:168) ආදිය යොදා පිසගත් හ. **මහාවංසයේ** එන එක් ස්ත්‍රියක් තැඹිලි කිරෙන් පිසූ බතක් ගිතෙල් මුසු කර සකස්කළ බව (එම, 39:17:181) සඳහන්වන අතර බතට අමතරට කුරක්කන්, තල, මුං, කවුපි, ආදී ධාන්‍ය වර්ග (වෛද්‍යක සාරාර්ථ සංග්‍රහය:1987:90-104) ද ආහාරයට ගත් බව මූලාශ්‍රයන් හී සඳහන් වේ. පෙරිමියන්කුලම ලිපියේ "මතෙරමපිබික"(අමරවංශ හිමි, 1969:118-119) යනුවෙත් මත්ස්‍ය බද්දක් ද පනවන්නට ඇත්තේ සමකාලීනව මත්ස්‍ය ආහාර ගැනීමට ජනතාව යොමු වී සිටි හෙයිනි. සාලිරාජ කථා වස්තුවෙහි තෙල් මස, මධු මස, පෙන මස, අඟුරු මස සහ තෙල් මිරිස් ආදිය යෙදූ සම්භාර සංයුක්තය යන පස් ආකාරයකට මාංශ පිසූ බව සඳහන් කරයි (සද්ධර්මරත්නාවලිය, 2011:627). වෙනත් ආහාරයක් සොයාගත නොහැකි වූ දුර්භික්ෂ සමයන් හී "කර කොල තම්බා" භික්ෂූණ්ට දන් දුන් ස්ත්‍රියක් පිළිබඳව (සීහලවත්ථුවේ සිංහල අනුවාදය, 2006:88) සඳහන්වන අතර මෙසේ තමන් ලත් කුමන ආහාරය වුව විවිධ ක්‍රමයන් අනුගමනය කරමින් රසවත්ව පිස පිළිගන්වන්නට පුරාතන ගෘහණියෝ සමත් වූහ.

විවාහ වන නව යුවළකට ඇතැම් අවස්ථාවන් හී දී නැන්දනියන් විසින් තම ලේලියට සහල් නැලියක්, මෝල් ගසක්, වංගෙඩියක්, කළයක් සහ බත් කන භාජනයක් (එම,4) පමණක් ලබා දී ඇත්තේ ලේලිය විසින් එකී ද්‍රව්‍යයන් භාවිත කරමින් තම පවුල පෝෂණය කිරීමට සකසුරුවම් විය යුතු බව අඟවමිනි. මෙසේ කුටුම්භ ජීවිතයකට අවතීර්ණ වන ගෘහණිය බහුපුරුෂ සේවනය නොකරමින්, නිවස තුළ තම වගකීම් නිසි ආකාරයෙන් ඉටු කරමින්, ස්වාමියා විසින් රැස් කරන ධනය ආරක්ෂා කිරීම හරහා ඔවුන්ගේ පවුල් ජීවිතය සාර්ථක වන බව යශෝධරාවගේ චරිතාපදානය විස්තර කරනමින් ද පෙන්වා දී ඇත (පූජාවලිය, 1999:677).

## 4. නිගමනය

ආර්ය අෂ්ටාංගික මාර්ගයට එළඹෙමින් ලෝකෝත්තර සුවය ළඟාකර ගැනීමේ පරම අභිලාශයෙන් යුක්ත වූ සිංහල බෞද්ධ සමාජය තුළ බුද්ධ දේශිතයේ සඳහන් ගෘහීය සබඳතා පිළිබඳ ඉගැන්වීම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූ අතර බිරිඳක, මවක, මිත්තනියක හෝ උපාසිකාවක වශයෙන් ගෘහණිය වගකීම් සහ යුතුකම් සමුදායකින් බැඳී සිටියා ය. ස්වාමිපුරුෂයා සමඟ සහයොගීව දුක සතුට බෙදාගත් ඇය ගුණවත්, නැණවත් සහ නිරෝගී වූ දරු පරපුරක් සමාජයට දායාද කරමින් තම අසල්වැසි ඥාති හිතමිත්‍රාදීන් සමඟ මනා

වූ සහසම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට සමත් විය. ස්වාමියා විසින් උපයන ධනය සකසුරුවමින් වියපැහැදම් කිරීම ද, නිවැසියන්ගේ පොෂණය හා නිරෝගී චිරජීවනය සළසමින් ද, ගෘහස්තයෙහි කුදුමහත් සෑම අවශයතාවක් ම සාධනය කරමින් දියණියක්, බිරින්දෑවක්, මවක්, සාත්තු සේවිකාවක් පමණක් නොව අසල්වාසීන් සමඟ සමාජ සම්බන්ධතා පැවැත්වූ යෙහෙළියක් හා ශාසනික පැවැත්මට දායකත්වය දැක්වූ පින්වත් උපාසිකාවක් ද වූවා ය. සමස්ත කුටුම්භයේම ආර්ථික, සමාජ සහ අධ්‍යාත්මික ගුණවගාවන් සංවර්ධනය කරන මාර්ගෝපදේශකවරිය වූ ගෘහණිය කුටුම්භය සහ සමස්ත සමාජය යන අංශ දෙක එකිනෙක පුරුද්දමින් එදා සිට අද දක්වාම පැවත එන සමාජ ක්‍රමයේ පෙරගමන්කාරිණිය වූවා ය.

## පරිශීලිත ග්‍රන්ථ


**අංගුත්තර නිකාය - 2,** (2014), සංස්:ඒ.පී. ද සොයිසා, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

**අංගුත්තර නිකාය - 3,** (2014), සංස්:ඒ.පී. ද සොයිසා, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

**කාව්‍යශේඛරය,** (2006). සංස්:සුචරිත ගම්ලත් සහ වේගිරියේ කීරාල, නුගේගොඩ: සරසවි ප්‍රකාශන.

**කෝකිල සන්දේශය,** (2009). සංස්:වී.ඩී.එස්.ගුණවර්ධන, කොළඹ:ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

**ගිරා සන්දේශය,** (2009). සංස්:රත්න කොඩිකාර, නුගේගොඩ:සරසවි ප්‍රකාශකයෝ.

**ඛුද්දක නිකායෙ ථේරීගාථා පාළි,** (1972). සංස්. ලබුගම ලඞකානන්ද ස්ථවිර, ත්‍රිපිටක කාර්යාලය, කොළඹ.

**තිසර සන්දේශය,** සංස්:ඒ.වී.සුරවීර, කොළඹ:ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

**දීඝ නිකාය-3,** (2013), සංස්:ඒ.පී ද සොයිසා, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**දීපවංසය,** (1970), සංස්.කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ:ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

**පූජාවලිය,** (1999), සංස්: වේරගොඩ අමරමෝලී හිමි, කොළඹ, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

**මහාවංසය,** (2012), සංස්:හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ වෙනත්, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මුණසිංහ, ඉන්ද්‍රාණී, (2001) **පැරණි ලක්දිව කාන්තාව,** කර්තෘ ප්‍රකාශන.

**යෝගරත්නාකරය,** 1 කොටස, (1996), සංස්: ඩී.පී.එස්.රන්දුනු, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. **වෛද්‍යක සාරාර්ථ සංග්‍රහය,** (1987), සංස්: ආර්යදාස කුමාරසිංහ, කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

**සද්ධර්මරත්නාකරය,** (2007), සංස්: වී.ඩී.එස්.ගුණවර්ධන, කොළඹ: සමයවර්ධන පොත්හල(පුද්ගලික) සමාගම.

**සද්ධර්මරත්නාවලිය,** (2011), සංස්:කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

**සද්ධර්මාලංකාරය,** (1997), සංස්: මීගොඩ පඤ්ඤාලෝක හිමි, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**සැළලිහිණි සන්දේශය,** (2001). සංස්: විල්ෆ්‍රඩ් පෙරේරා, නුගේගොඩ:සරසවි ප්‍රකාශකයෝ. **සීහලවත්ථුවේ සිංහල අනුවාදය,** (2006), පොල්වත්තේ බුද්ධදත්ත හිමි, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,

*Epigraphia Zeylanica,* (1994). *volume-III,* D.M.D.Z.Wickramasinghe, Madras: Asian Educational Services.

කොත්මලේ අමරවංශ හිමි, **ලක්දිව සෙල්ලිපි,** කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, 1969,